# කොවිඩ් - 19 : ශ්‍රී ලංකා සංක්‍රමණික ශ්‍රමිකයින්හට කොවිඩ් - 19 වසංගතයේ බලපෑම අවම කිරීම සඳහා ශ්‍රී ලංකා රජයට නිර්දේශ කරන ලද යුතු ක්ෂණික පියවර සහ පසුව ගත යුතු ක්‍රියාමාර්ග


කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය



Women and Media Collective
Established 1984



Norwegian Embassy
*Colombo*

# හැඳින්වීම

දැනට පැතිරී යන කෝවිඩ්-19 වසංගතය විසින් ගෝලීය ආර්ථිකයන්ට, බිලියන ගණනක් වූ ජනතාවගේ සෞඛ්‍යයට බලපෑම් එල්ල කර ඇති අතර සමාජ හැසිරීම් අසමසම මට්ටමකට ප්‍රති-අර්ථ දක්වා ඇත.සිය දහස් ගණනක කම්කරුවන්ගේ වැටුප් අඩු කිරීම, රැකියාවෙන් ඉවත් කිරීම හෝ නැවත සිය නිවෙස් කරා යාමට පැවසීම හෝ විදේශීය සංක්‍රමණික සේවකයින් සඳහා ඔවුන්ගේ මව් රටවලට යාමට පැවසීමත් සමඟ රටවල් තුළ මෙන්ම ලොව පුරා ශ්‍රම වෙළඳපොළ කෙරෙහි ඇති කර ඇති බලපෑම දුෂ්කර වේ. විදේශයන්හි සේවය කරන සංක්‍රමණික සේවකයින් රැකියා සුරක්ෂිතතාවයක් නොමැතිකම, සෞඛ්‍ය සත්කාර සේවා සහ ආරක්ෂිත ජීවන තත්ත්වයන් සඳහා ප්‍රවේශය නොමැතිකම යන කරුණු පදනම් කරගෙන වඩාත් අවදානමට ලක්ව ඇත. ඇස්තමේන්තු කර ඇති පරිදි ශ්‍රී ලාංකිකයෝ මිලියන 1.8 ක් විදේශයන්හි සේවය කරති. 2019 වසරේ දී මෙම සේවකයෝ ශ්‍රී ලංකා ආර්ථිකයට ඇමරිකානු ඩොලර් බිලියන 6.7 කින් දායක වූහ.[1] සෑම ගෘහ ඒකක 11 න් එක් අයෙකුට ම ජාත්‍යන්තර ප්‍රේෂණ මුදල් ලැබී ඇති බවත්, සංක්‍රමණිකයන් සාමාන්‍යයෙන් මසකට වරක් මුදල් ප්‍රේෂණය කරන බවත්, මසකට ප්‍රේෂණය කරන මුදලේ සාමාන්‍ය අගය රුපියල් 40,000 ක් බව ඇස්තමේන්තු පෙන්වා දෙන ආකාරය මෑතක දී කරන ලද අධ්‍යයනක් පෙන්වා දේ.[2]

මෙම වසංගතය නිසාවෙන් බොහෝ සංක්‍රමණික ශ්‍රම ගමනාන්තයන් වෙත අගුලු දැමූ අතර එය මෙම ශ්‍රමිකයින්ගේ ඉපැයීමේ හැකියාව සහ ජීවන තත්ත්වය කෙරෙහි බරපතල ලෙස බලපෑමක් ඇති කර තිබේ. ශ්‍රී ලංකාවට මෙමගින් ඇති කරන ලද වක්‍ර බලපෑම් ක්ෂණිකව ම ආකාර දෙකකින් යුක්ත විය: එනම් ජාතික ආර්ථිකය සඳහා විදේශ විනිමය ඉපැයීම් විශාල ලෙස පහත වැටීම සහ මැද පෙරදිග සේවයේ නියුතු තම පවුලේ සාමාජිකයන් ප්‍රේෂණය කරන මුදල් මත යැපෙන අයගේ කුටුම්භ ආදායම පහත වැටීම.[3] රටවල් පුරා වසංගතය පැතිරීමත් සමඟ ම, වෙනත් රටවල සිරවී සිටින ශ්‍රමිකයෝ සහ ශ්‍රී ලංකාවේ වෙසෙන ඔවුන්ගේ පවුල් අද අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස දුගීභාවයට පත්වීමේ අවදානමට ලක්ව සිටිති.

මෙම ප්‍රතිපත්ති සංක්ෂිප්තය ලාංකික සංක්‍රමණික සේවකයින්ගේ ආරක්ෂාව සහ යහපැවැත්මට අදාළ ප්‍රධාන කරුණු ඉස්මතු කිරීමට අදහස් කරයි. ශ්‍රී ලාංකික සංක්‍රමණිකයන්ගේ හදිසි අවශ්‍යතා සපුරාලීම සඳහා රජය විසින් ගත යුතු යෝජිත මාර්ගෝපදේශ හා ක්‍රියාමාර්ග මාලාවක් මෙම සංක්ෂිප්තයේ අඩංගු වේ.

## ශ්‍රී ලංකා රජයේ මැදිහත්වීම්

2020 අප්‍රියෙල් මස මැද භාගයේදී, ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශය විදේශ සේවා නියුක්ති කාර්යාංශය (SLBFE) සමඟ එක්ව බහරේන්, කුවේට්, ජෝර්දානය, ලෙබනනය, ඕමානය, සවුදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, කටාර්, ඉරානය සහ ඊශ්‍රායලය යන රටවල්වල පිහිටුවා තිබෙන සිය කාර්යාල සමඟ වීඩියෝ සම්මන්ත්‍රණ පැවැත්වී ය.[4] විරැකියාව වැඩිවීම, ගිවිසුම් අහිමිවීම, වැඩ බලපත්‍ර දීර්ඝ නොකිරීම සහ තාවකාලික නිදහස් වැඩ නතර කිරීම වැනි ගැටළු සටහන් කර ගන්නා ලදී. ඒවාගේම, ශ්‍රී ලංකාවේ වෙසෙන පවුල්වල ජීවන තත්ත්වය කෙරෙහි වන බලපෑම ද හඳුනා ගන්නා ලදී.

**මෙම කරුණු තිබියදීත්, පුහුණුව ලබමින් සිටි ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයින් සහ චීනයේ සහ දකුණු ආසියාවේ විශ්ව විද්‍යාලවල ලියාපදිංචි වූ සිසුන් මාර්තු සහ අප්‍රේල් මාසවල දී නැවත මෙරටට ගෙන්වා ගැනීමට රජය ප්‍රමුඛත්වය දී තිබේ.**

---

[1] http://www.ips.lk/talkingeconomics/2020/04/17/covd-19-and-foreign-exchange-woes-can-sri-lanka-find-a-way-out/
[2] http://www.ips.lk/talkingeconomics/2020/04/17/covd-19-and-foreign-exchange-woes-can-sri-lanka-find-a-way-out/
[3] https://www.cbsl.gov.lk/en/news/the-government-and-the-central-bank-of-sri-lanka-introduce-furthermeasures-to-preserve-the-foreign-currency-reserve-position-of-sri-lanka
[4] https://www.mfa.gov.lk/foreign-ministry-and-slbfe-assist-sri-lankans-in-the-middle-east/

2020 මාර්තු මාසයේ දී වසංගතය පැතිර ගිය දා පටන් විදේශගත ශ්‍රී ලාංකිකයන් නැවත මව්බිමට ගෙන්වා ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය විදේශ සබඳතා අමාත්‍යාංශය හරහා මැදිහත්වීම් ගණනාවක නිරත වී තිබේ. ශ්‍රී ලංකාවට ආපසු යාමට අපේක්ෂා කරන විදේශගත ශ්‍රී ලාංකිකයන් නැවත මෙරටට ගෙන්වා ගැනීමේ පියවර සැලසුම් කිරීම සඳහා ඔවුන්ගේ තොරතුරු ලියාපදිංචි කර ගැනීමට හැකිවන පරිදි රජය විසින් 2020 මාර්තු 26 දින 'Contact Sri Lanka' වෙබ් ද්වාරය පිහිටුවන ලදී. මෙහි 2020 මැයි 29 වන විට රටවල් 123 කින් පුද්ගලයන් 42,000 ක් ලියාපදිංචි වී තිබේ. 34,881 ක් සංක්‍රමණික සේවකයන් වන අතර ඔවුන්ගෙන් 20,893 ක් මැද පෙරදිග ජීවත් වන සහ සේවය කරන අය වේ.[5]

ශ්‍රී ලංකික සංක්‍රමණික ශ්‍රමිකයන් විශාල ප්‍රමාණයක් ආපසු මෙරටට ගෙන්වා ගන්නා ලෙස ඉල්ලා සිටිය ද, මෙම ශ්‍රමිකයින් ශ්‍රී ලංකාවට නැවත පැමිණීම පිළිබඳව ප්‍රවේශම් විය යුතු බව ශ්‍රී ලංකා රජය පැහැදිලි කර තිබේ. වලංගු රැකියා වීසා බලපත්‍ර ඇති අයගේ නැවත පැමිණීමේ ඉල්ලීම් නැවත සලකා බැලිය යුතු බව මැයි මස මැද භාගයේ දී විදේශ සබඳතා අමාත්‍යාංශය ප්‍රකාශ කළේ ය. ඒ වෙනුවට, ගමනාන්ත රටේ නීතිවිරෝධී සංක්‍රමණික සේවකයන් වන වීසා බලපත්‍ර නොමැති අයට, සෞඛ්‍ය පහසුකම් ආදිය සඳහා වැඩි ඉඩකඩක් නොමැති නිසා ඔවුන්ට සහාය විය හැකි ආකාරය සොයා බැලීමට රජය බලාපොරොත්තු වේ.[6] මේ අවස්ථාවේ දී රජයේ ස්ථාවරය විසින් වැටුප් නොගෙවීම, වැටුප් අඩු කිරීම, අවශ්‍ය සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශය නොමැතිකම සහ අප්‍රේල් මාසයේ දී ගමනාන්ත රටවල දූත මණ්ඩල විසින් මතු කරන ලද සියලු ගැටලු හේතුවෙන් වැඩිවන මූල්‍ය බාධාවන්ට මුහුණ දී සිටින බොහෝ පුරවැසියන්ගේ දරුණු තත්ත්වය නොසලකා හැර ඇත. සුළු ආදායමක් සහිතව හෝ ආදායමක් නොමැතිව විදේශ රටක ඉතිරිව ඇති සංකීර්ණතා පිළිගැනීම හෝ එම ගැටලුවලට විසඳුම් ලබා දීම වෙනුවට, රජය නැවත වරක් රැඳී සිටින අයට වියළි සලාක සහ අවශ්‍ය ඖෂධ ලබා දීමට උත්සාහ කර දීමට ඉදිරිපත් විය.[7]

2020 අප්‍රේල් මාසයේ දී කුවේට් රජය විසින් ආපසු සිය රටට ගෙන්වා ගැනීම සඳහා වීසා බලපත්‍රයක් නොමැති ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ට ලියාපදිංචිවීමට පොදු සමාවක් ලබා දුන් අතර, ආසන්න වශයෙන් 100,000 ක් ශ්‍රමිකයින් අතරින් 500 කට අඩු සංඛ්‍යාවක් පමණක් එසේ කර තිබුණි. අප්‍රේල් මාසයේ දී අගුලු දැමීම නිසාවෙන් ශ්‍රී ලංකා ගුවන් කලාපය පැමිණෙන ගුවන් ගමන් සඳහා වසා දමා තිබුණි. එමනිසා, කුවේට් රජය විසින් ශ්‍රී ලාංකිකයින් 460 දෙනෙකු නැවත මව්රටට යවන විට එය මැයි මාසවයි මැද භාගය විය.[8] ඔවුන් ආපසු පැමිණ ශ්‍රී ලංකාවේ නිරෝධායන මධ්‍යස්ථාන වෙත ගෙන යන විට ආපසු පැමිණි අයගෙන් 412 දෙනෙකු වෛරසය ආසාදනය වී ඇති බව සොයා ගන්නා ලදී.

## නිරෝධායන මධ්‍යස්ථාන: ත්‍රිවිධ හමුදාව සහ ශ්‍රී ලංකා රජයේ සෞඛ්‍ය සේවාවන්

වසංගතය ආරම්භ වී සති කිහිපයක් ඇතුළත නැවත සිය රට බලා පැමිණෙන අය සඳහා නිරෝධායන මධ්‍යස්ථාන පිහිටුවීමේ අවශ්‍යතාවය ශ්‍රී ලංකා රජය විසින් කඩිනමින් හඳුනා ගනු ලැබී ය. කෙසේ වෙතත්, මෙම නිරෝධායන මධ්‍යස්ථාන පිහිටුවීමේ හා මෙහෙයවීමේ කාර්යයෙහි සෞඛ්‍ය අමාත්‍යාංශය නොව ශ්‍රී ලංකා හමුදාව නිරත වීම කනස්සල්ල ඇති කරන වන කරුණක් විය. නිරෝධායන මධ්‍යස්ථානවලට නැවත පැමිණෙන සංඛ්‍යාවේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව ශ්‍රී ලංකා හමුදාපතිවරයා ප්‍රකාශ නිකුත් කළ අතර එම ප්‍රකාශ සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජිතයෙකු විසින් ඉදිරිපත් කරන ලද ප්‍රකාශවලට වඩා වෙනස් වේ. අවශ්‍ය සති 2 ක නිරෝධායන කාලය සම්පූර්ණ කළ අයට ලබා දෙන නිරෝධායනයට ලක්වීම සම්බන්ධ සහතිකපත්වල ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාව ඉස්මතු කර දක්වා තිබේ.

5 https://www.mfa.gov.lk/reassures-continued-repatriation/
6 https://www.mfa.gov.lk/osls-to-rethink-repat/
7 https://www.mfa.gov.lk/osls-to-rethink-repat/
8 https://www.mfa.gov.lk/repatriation-from-kuwait/

මේ වන විට ත්‍රිවිධ හමුදාව නිරෝධායන මධ්‍යස්ථාන 44 ක් පවත්වාගෙන යන අතර එහි පුද්ගලයින් 4386 දෙනෙකු නිරෝධායන ක්‍රියාවළියට භාජනය වේ.[9] දකුණු ආසියා කලාපය තුළ වෙසෙන ශ්‍රී ලාංකිකයන් නැවත මෙරටට ගෙන්වා ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීමේ දී කලාපය තුළ හමුදා පුහුණුව ලැබමින් සිටි ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයන් වෙත අවධානය යොමු කිරීම සටහන් කළ යුතු ය.

ශ්‍රී ලංකාවේ කෝවිඩ්-19 ව්‍යාප්තිය කළමනාකරණය කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් තිබේ. පළමු කාරණය නම්, වෛරසයෙන් පීඩා විඳින අයට මෙන්ම රෝග ලක්ෂණ නොමැති අයට සහ පසු විපරම් හා අධීක්ෂණ අවශ්‍ය වන අයට ප්‍රතිකාර කිරීම සඳහා රටේ විශිෂ්ට සෞඛ්‍ය සේවා අංශයේ යටත් භූමිකාවයි. අනෙක් කාරණය නම් රටේ ආර්ථිකයේ පදනම වන ප්‍රේෂණ මුදල් වල හිමිකරුවන් වන විශේෂයෙන් මැදපෙරදිග සේවය කරන 'රට විරුවෝ' ලෙස හඳුන්වන සංක්‍රමණික සේවකයින් නොතකා ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයින් අගය කිරීමයි.[10]

## නැවත තම රටට ගෙන්වා ගැනීම ඉල්ලා සිටින ශ්‍රී ලාංකිකයන් සඳහා පීසීආර් (PCR) පරීක්ෂණ

නැවත මෙරටට ගෙන්වා ගැනීමට අපේක්ෂා කරන ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයින් සේවයේ යොදවා ඇති රටවල රජයන් වෙත ශ්‍රී ලංකා රජය කරන ඉල්ලීම්වලින් එකක් වන්නේ, එම ශ්‍රමිකයින්ගේ සත්කාරක රටවලින් පිටවීමට පෙර නොමිලේ PCR පරීක්ෂණ පැවැත්වීමයි. මැයි මාසයේ දී ශ්‍රී ලාංකිකයන් 466 දෙනෙකු ආපසු මෙරටට ගෙන්වා ගැනීමේ දී කුවේට් රජය මෙම ඉල්ලීම ප්‍රතික්ෂේප කළේය. 2020 ජුනි මාසයේදී ලෙබනනය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය නැවත මෙරටට ගෙන්වා ගැනීමට නියමිත ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයින්ට කිසිදු වියදමක් නොමැතිව මෙම පරීක්ෂණය පැවැත්වීමට එකඟතාවය පළ කර තිබේ.[11]

## සංක්‍රමණික සේවකයින්ගේ අවදානම් සහගත ජීවන තත්ත්වයන්

නිල් කරපටි සහ ලේඛනගත නොවූ සංක්‍රමණික ශ්‍රමිකයින්ගේ තත්ත්වය දිගටම බරපතල ලෙස ඉස්මතු වෙමින් පවතී. නවාතැන්, ආහාර, තම දරුවන් සඳහා පාසල් අධ්‍යාපනය, සෞඛ්‍ය සත්කාරක සේවා සඳහා යොදවන ලද ස්ථාවර මාසික ආදායමක් ලැබූ බොහෝ නිල් කරපටි ශ්‍රමිකයින්ගේ වැටුප් විශාල වශයෙන් අඩු වී තිබේ. මෙයින් අදහස් කරන්නේ ඔවුන්ගේ ජීවන වියදම දැරීමටත් ඔවුන්ගේ පවුල්වලට සහයෝගය දැක්වීමටත් ඔවුන්ට නොහැකි බවයි. දීර්ඝකාලයක් පැවති අගුලු දැමීම මූලික අවශ්‍යතා ලබා ගැනීමේ හැකියාව ද දැඩි ලෙස සීමා කරයි.

ලේඛනගත නොවූ හෝ ලියාපදිංචි නොවූ සංක්‍රමණික ශ්‍රමිකයින් වඩාත් අවදානම් සහිත කණ්ඩායම්වලින් එකක් බවට පත්ව ඇත. අගුලු දැමීම් සහ රැකියාවෙන් ඉවත් කිරීම් ක්‍රියාත්මක කිරීමත් සමඟම, මෙම ශ්‍රමිකයෝ ආහාර හෝ නවාතැන් සඳහා ගෙවීමට ආදායමක් නොමැතිව බොහෝ දුෂ්කරතාවයන්ට මුහුණ දී සිටිති; ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට ඔවුන් සඳහා නවාතැන් සැපයීමට නොහැකි වූ අවස්ථාවන්වල දී සමහරුන්ට කඳවුරුවල රැකවරණය පතන්නට සිදුවී තිබේ. ගල්ෆ් රටවල ගැබ්ගෙන සිටින කාන්තාවන්ගේ තත්ත්වය පිළිබඳ වාර්තා මගින් ඔවුන් මුහුණ දෙන

[9] https://alt.army.lk/covid19/content/4386-persons-are-still-quarantine-44-island-wide-qcs-nocpco

[10] https://alt.army.lk/covid19/content/4386-persons-are-still-quarantine-44-island-wide-qcs-nocpco 'අද සවස වන විට (පැය 1600) වීරෝදාර නාවිකයින් අතර තවත් කෝවිඩ්-19 වෛරසය ධනාත්මක වූ අවස්ථා 05 ක් වාර්තා විය. මේ අතර තවත් වීරෝදාර නාවිකයින් 04 දෙනෙකු සුවය ලබා රෝහල්වලින් නික්ම ගොස් තිබේ. මේ වන විට, නාවික හමුදාවේ වීරෝදාර නාවිකයින් අතර කෝවිඩ්-19 වෛරසය ආසාදනය වීමේ සමස්ත සංඛ්‍යාව 882 ක් බව තහවුරු කර තිබේ' https://www.mfa.gov.lk/ta/4339-promotional-seminar-on-remittances-organised-for-the-sri-lankan-migrant-community-in-israel/

[11] https://www.mfa.gov.lk/lebanon-free-pcr-tests/

අවදානමේ අතිශය දරුණු තත්ත්වයන් අනාවරණය වී තිබේ.[12] අතරමං වූ හෝ ආපසු යාමට නොහැකි වූ සංක්‍රමණික ශ්‍රමිකයින්ට වියළි සලාක වැනි ආධාර ලබා දීම වැනි සහාය දැක්වීමේ වැඩපිළිවෙලක් ශ්‍රී ලංකා රජය විසින් ආරම්භ කර තිබේ.[13] වර්තමාන සන්දර්භය තුළ මෙය ප්‍රශංසනීය පියවරයන් වුවත්, මෙය එය රටවල් කිහිපයක සංක්‍රමණික ශ්‍රමිකයින් සංඛ්‍යාවක් පමණක් වෙත ළඟා වන කෙටිකාලීන පියවරක් ලෙස පිළිගත යුතු වේ. විශේෂ පොදු සමාවක් මගින් ශ්‍රී ලංකාවේ වීසා තත්ත්වය විධිමත් කිරීම සඳහා පහසුකම් සැලසීම සඳහා ඉතාලියේ රජය සමග එකඟතාවකට පැමිණීමට ද රජයට හැකි වී ඇති බව අපි සටහන් කරමු.[14] රැකියාවන් සඳහා සංක්‍රමණය වූ ශ්‍රී ලාංකිකයන් නීතිමය ලියකියවිලි නොමැතිව සිටින වෙනත් රටවල ද එවැනි ශ්‍රමිකයින්ගේ ප්‍රයෝජනය සඳහා එවැනි සාකච්ඡා අනිවාර්යයෙන්ම සිදු කළ යුතු ය.

## නැවත පැමිණි සංක්‍රමණික සේවකයින්

මේ වන විට අවම වශයෙන් සංක්‍රමණික ශ්‍රමිකයින් 50,000 ක් වත් ශ්‍රී ලංකාවට නැවත ගෙන්වා ගැනීමට ඉල්ලීම් කර ඇති බව වාර්තා වේ. කඩිනමින් අවධානය යොමු කළ යුතු කාරණය වන්නේ, රටේ ආර්ථිකයට සහ ජනගහනයේ විශාල කොටසකගේ ජීවන තත්ත්වයට අසමසම ලෙස දායක වූ මෙම ශ්‍රමිකයින්ට රටක් වශයෙන් ආපසු ලබා දිය හැකි දේ පිළිබඳ කෙටිකාලීන හා දිගු කාලීන පිළියම් සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමයි.

නිරෝධායන කාල සීමාව අවසන් වීමෙන් පසු නැවත සිය ගම්බිම් බලා යන අය සමාජයෙන් නෙරපා හැරීම පිළිබඳ තැතිගන්වනසුලු වාර්තා මතු වෙමින් තිබේ. ඔවුන්, බොහෝ විට ඕනෑම ආසාදනයක් වෛද්‍ය විද්‍යාත්මකව ඉවත් කර ඇති අය ලෙස නොව, ප්‍රජාවට අනතුරක් වන වෛරසය රැගෙන යන පුද්ගලයින් ලෙස සළකනු ලැබේ.

මේ වසර තුළ දහස් සංඛ්‍යාත සංක්‍රමණික ශ්‍රමිකයන් ශ්‍රී ලංකාවට නැවත පැමිණිය හැකිය යන අපේක්ෂාව ඇතිව, රජය සමාජය තුළ ඔවුන්ගේ යහපැවැත්ම සහ රට තුළ රැකියා අවස්ථා කල්තියා සහතික කරන ලෙස අපි තරයේ නිර්දේශ කරමු. කෝවිඩ් -19 වසංගතය මාස කිහිපයක් ඇතුළත මැකී නොයනු ඇත. එය රටේ සියලුම පුරවැසියන්ගේ සෞඛ්‍යයට සහ විදේශ රැකියාවල නියුතු අයගේ සෞඛ්‍යයට බලපාන තීරණාත්මක සාධකයක් වනු ඇත.

## අනාගතය සඳහා රජයේ ප්‍රතිපත්ති සහ වැඩසටහන්

සංක්‍රමණික ශ්‍රමිකයින් නැවත මෙරටට ගෙන්වා ගැනීමට ශ්‍රී ලංකා රජය ගෙන ඇති උත්සාහය අපි අගය කරන්නෙමු.[15] දකුණු කොරියාවේ නව විදේශ රැකියා අවස්ථා, තේ සඳහා නව වෙළඳපොලවල් සහ ආරක්ෂිත ආම්පන්න සඳහා වෙළඳපල සොයා ගැනීම වැනි දේ සඳහා රජය පියවර ගෙන තිබේ.[16] ඒ අතරම, විදේශයන්හි අතරමංව සිටින ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ අයිතිවාසිකම්වලට රජය ගරු කිරීම ද වැදගත් ය. මෙම වසංගතය මධ්‍යයේ සංක්‍රමණික ශ්‍රමිකයින්ට ඔවුන්ගේ වර්තමාන රැකියාව අහිමිවිය හැකි ද යන කාරණය නොසලකා ශ්‍රී ලංකාවට ආපසු පැමිණීමට සහාය වීම රජයේ ප්‍රමුඛතාවය විය යුතු වේ. උදාහරණයක් ලෙස අප්‍රේල් මාසයේ දී නිදසුනක් ලෙස කුවේටය වැනි බටහිර ආසියානු රටවලින් ශ්‍රී ලංකාවට සංක්‍රමණික ශ්‍රමිකයන් රැගත් ගුවන් ගමන් අත්හිටුවීම,

---

[12] https://www.pressreader.com/sri-lanka/sunday-times-sri-lanka/textview;Desperate Cries for help from Sri Lankan Mothers to be stranded in West Asia. 14 June 2020.

[13] https://www.mfa.gov.lk/foreign-ministry-and-slbfe-assist-sri-lankans-in-the-middle-east/

[14] https://www.mfa.gov.lk/sri-lanka-missions-facilitate-to-regularise-visa-status-of-sri-lankans-in-italy-under-special-amnesty/

[15] https://www.mfa.gov.lk/media-release-7-5-2020/; https://www.mfa.gov.lk/repatriation-from-kuwait/; https://www.mfa.gov.lk/reassures-continued-repatriation/

[16] https://www.mfa.gov.lk/foreign-secretary-outlines-role-missions-tackling-covid-19-pandemic/; https://www.mfa.gov.lk/foreign-minister-discusses-repat-and-new-job-opportunities/

නැවත වරක් අතහැර දමා ඇති අයගේ තත්ත්වය පිළිබඳව කනස්සලු සහගත තත්ත්වයක් උද්ගත කරයි. නැවත පැමිණීම ප්‍රමාද වන සංක්‍රමණික ශ්‍රමිකයින් සඳහා වන සේවාවන් ශක්තිමත් කරනු ලබන්නේ කෙසේද? විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයින්ට ආරක්ෂිතව ආපසු පැමිණීම පිළිබඳ තොරතුරු ලබා ගැනීමට ඇති ප්‍රවේශය කුමක්ද? නැවත පැමිණෙන සංක්‍රමණික ශ්‍රමිකයින්ගේ වැඩි වන සංඛ්‍යාව අන්තර්ගත කිරීම සඳහා රජය රට තුළ නිරෝධායන මධ්‍යස්ථාන වැඩි කරයිද? නැවත පැමිණෙන අයට රට තුළ රැකියා ලබාදීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග මොනවාද?

කෝවිඩ් -19 වසංගතය හේතුවෙන් මතුවෙමින් පවතින ගැටලුවලට ක්ෂණික ප්‍රතිචාර දැක්වීමක් ලෙස ගත හැකි ක්‍රියාමාර්ග ලෙස අපි පහත සඳහන් නිර්දේශ රජයට ඉදිරිපත් කරන්නෙමු. බලපෑමට ලක් වූ සංක්‍රමණික ශ්‍රමිකයින්ට සහන සැලසීමේ මාර්ගයක් ලෙස අවශ්‍ය පියවර ගැනීම සඳහා සිවිල් සමාජය විසින් ඉදිරිපත් කර ඇති කරුණු මෙම නිර්දේශ තුළ ඇතුළත් වේ.

## නිර්දේශඃ ශ්‍රී ලංකා රජයඃ

1. ඒ ඒ රට සමඟ ඇති කරගත් ද්විපාර්ශ්වික ගිවිසුම් සේවකයාට සේව්‍යයාගේ ගිවිසුම්ගත බැඳීම් ආරක්ෂා කිරීම තුළින් ගෞරවයට පාත්‍රවන බවට සහතික වීම.

2. රැකියා අහිමිවීමේ අවදානමක් ඇති හෝ දැනටමත් රැකියා අහිමිවී ඇති ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයින් හඳුනා ගැනීම සඳහා යොදාගෙන ඇති ක්‍රියාමාර්ග වැඩි දියුණු කිරීම සහ මෙම දුක්ගැනවිලි විසඳීම සඳහා ගෙන ඇති සියලු පියවරයන් පිළිබඳව වගවීම.

3. අවදානමට ලක්විය හැකි සංක්‍රමණික ශ්‍රමිකයින්ගේ මෙන්ම ආදායම් හිඟකම, ප්‍රමාණවත් සෞඛ්‍ය සේවාවක් ලබා ගැනීම සහ රැකියා ගිවිසුම් උල්ලංඝනය කිරීම හේතුවෙන් නැවත තම රටට ගෙන්වා ගන්නා ලෙස ඉල්ලා සිටින සංක්‍රමණික ශ්‍රමිකයින්ගේ මානව හිමිකම් සහ ආත්ම ගෞරවය ආරක්ෂා කිරීම.

4. සියලුම ශ්‍රී ලාංකික සේවකයින් සඳහා සෞඛ්‍ය ආරක්ෂණය සහ සමාජ ආරක්ෂණ ආවරණය සහතික කිරීම සඳහා රැකියා ලබාදුන් රටවල් සමඟ වැඩදායක සාකච්ඡාවක නිරතවීම.

5. විශේෂයෙන් වලංගු වීසා බලපත්‍ර නොමැති අය අතර, තැනැත්තන් වෙළඳාම් කිරීමේ සිදුවීම් ඇතිවීමේ හැකියාව අවම කිරීම සඳහා රැකියා ලබාදුන් රටවල් සමඟ වැඩදායක සංවාදයක නිරතවීම.

6. වසංගතය නිසාවෙන් විදේශ රැකියාවලට යාමට අකමැති හෝ නොහැකි සංක්‍රමණික ශ්‍රමිකයින්ගේ සමාජ-ආර්ථික ප්‍රතිසංවිධානය සඳහා වැඩසටහන් සම්පාදනය කිරීමට කම්කරු, සමාජ සුභසාධන, ආර්ථික කටයුතු, කාන්තා කටයුතු, කෘෂිකර්මාන්තය, කුඩා කර්මාන්ත වැනි අමාත්‍යාංශ තුළ විශේෂ යාන්ත්‍රණ ස්ථාපිත කිරීම පිණිස ඵලදායී ක්‍රියාමාර්ග සකස් කිරීම.

7. විදේශ රැකියාවල යෙදීමට පෙර හෝ විදේශගතව සිටිය දී ශ්‍රී ලංකාවේ බැංකුවලින් ණය ලබාගෙන ඇති සංක්‍රමණික සේවකයින්ට ණය සහන ලබා දීම කඩිනම් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම.

8. ශ්‍රී ලංකාවේ සංක්‍රමණික ශ්‍රමිකයින්ගෙන් යැපෙන පවුල් සඳහා රැකියාව අවසන් කිරීම නිසවෙන් හෝ විදේශගතව සිටින පවුලේ සාමාජිකයින්ගේ ප්‍රේෂණ මුදල් ලැබීමේ දීර්ඝ ප්‍රමාදයන් හේතුවෙන් මූල්‍ය දුෂ්කරතාවන්ට මුහුණ දී සිටින පවුල් සඳහා සහාය ලබාදෙන වැඩසටහන් සකස් කිරීම. මෙම වැඩසටහන් අතරට නිවාස සඳහා කුලිය ලබාදීම හෝ මෙම පවුල් ලබාගෙන

ඇති ස්වයං රැකියා ව්‍යවසායකත්ව ණය වැනි මූල්‍යමය බර ගෙවීම ප්‍රමාද කිරීම හෝ අවලංගු කිරීම ඇතුළත් කළ හැකි ය.

9. අනිවාර්යය නිරෝධායන ක්‍රියාපටිපාටි සම්පූර්ණ කර ඇති සංක්‍රමණික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සමාජ අපකීර්තියට හා කොන්කිරීමට භාජනයවීම වැළැක්වීම සඳහා ජනමාධ්‍ය හරහා වැඩදායක සමාජ සංවාදයක් ආරම්භ කිරීමට මැදිහත්වීම.

10. දැනට නීතිමය ලියකියවිලි නොමැති ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයින් සඳහා වීසා බලපත් ලබාදීම විධිමත් කිරීම සඳහා පොදු සමාවක් ලබා දීමට සඳහා ගමනාන්ත රටවල් සමඟ ක්‍රියාකාරීව සම්බන්ධවීම.